කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# බුද්ධ ධර්මය
(I කොටස )

08 වන ශ්‍රේණිය

මිනිත්තු 30

නම/ විභාග අංකය ..................................................

* සැලකිය යුතුයි
* I කොටස කෙටි ප්‍රශ්න හා බහුවරණ ඇතුලත් ප්‍රශ්න 20 ක් . ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
* එක් පිළිතුරකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40 කි.

---

- වරහන් තුල දී ඇති වදන් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැන් පුරවන්න.

(01) දුරසිට වුවද ගෙනැවිත් පිරිණමන සිව් පසය පිළිගැනීමට සුදුසු වන නිසා මහ සඟ රුවන නම් .............................................. වන සේක.

(02) අන් අයට විපතක් ඇති වූ විට එය තමාට සිදුවුවාසේ සිතා කටයුතු කිරීම බුදු දහම ඉතා අගය කරයි. මෙම ක්‍රියාවලිය අප හඳුන්වන්නේ .............................................. යනුවෙනි.

(03) ''මහරජ, මාගේ වංශය බුද්ධ වංශයයි, ඔබේ වංශය ශාක්‍ය වංශයයි'' බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුරයේදී මෙසේ වදාළේ .............................................. රජුටය.

(04) ''එන්න ඔබගේ පැමිණීම ඉතා හොඳයි'' යනුවෙන් බුදු රජාණන් වහන්සේ සිනහ මුසු මුහුණින් ආගන්තුකයින් පිළි ගනිතැයි අගය කළේ .............................................. බමුණාය.

(05) තමා සිතන, කියන, කරන සෑම කටයුත්ත කම විපාක විඳීමට සිදුවන්නේ .............................................. මය.

- පහත ප්‍රකාශය හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.

(06) අධම්ම චරියා, විෂම චරියා නමින් හඳුන්වන්නේ අකුසල් ය. ( )

(07) යසෝධරා දේවිය බුදුරජාණන් වහන්සේගේ ගුණ වණමින් රහල් කුමරුට ගැයූ ගාථා නම් කරන්නේ ජය මංගල ගාථා නමිනි. ( )

(08) සුනීත, සෝපාක යනු නුවණැති යන්ගේ හඬට සවන් දී ජීවිත ජයගත් දරුවන්ය. ( )

(09) පංචශීලය විශ්ව සාධාරන දහමකි. ( )

(10) විවිධ අවස්ථාවන් වල බුදු රජාණන් වහන්සේගේ උපස්ථායක තනතුර හෙබවූ භික්ෂුවක් වන්නේ ඡන්න භික්ෂුවය. ( )

- ගැලපෙන වදන් යා කරන්න.

| | | |
|---|---|---|
| (11) | මනා පිළිවෙත් පුරන මහ සඟරුවන | වචී පරම |
| (12) | හිරි, ඔතප් නම් | සුපටිපන්න |
| (13) | බොහෝ ඇසූ පිරූ තැන් ඇති තැනැත්තා | දේව ධර්මයයි |
| (14) | වචනයෙන් පමණක් සංග්‍රහ කරන තැනැත්තා | කුසල මූලයන්ය |
| (15) | අලෝභ, අහේෂ, අමෝහ | බහුශ්‍රැත |

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(16) සිතා මතා කරන ක්‍රියා බුදු සමව හඳුන්වන්නේ,
(i) කුස වශයෙනි (ii) කර්ම වශයෙනි (iii) අකුසල් වශයෙනි

(17) මස් පිණිස ඌරන් මැරූ චුන්ද මිය ගියේ ඌරකු මෙන් කෑගසමිනි. මෙම අකුසල කර්මය සංචශීලයට අනුව,
(i) ප්‍රාණඝාතයයි (ii) අදත්තාදානයයි (iii) මිථ්‍යා දෘෂ්ඨියයි

(18) ''මුසා වාදා වේරමණී සික්ඛා පදං සමාධි යාමි'' යන්නෙහි නවැරදි අදහස වන්නේ,
(i) බොරු කීමෙන් වැළකෙමි යන්නෙමි.
(ii) බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යන්නය.
(iii) බොරු නොකියමි යන්නය.

(20) දිලිනි සහ කමලිනී කුඩා කල සිට ඉතා හොඳ මිතුරියක් ය, හත ශ්‍රේණියට සමත්ව යාමේදී වෙනත් පන්තියකට යාමට කමලනීට සිදු විය. මෙය මහා දුකක් වුවද කමලනී එය විඳ දරා ගත්තාය. මෙම දුක හඳුන්වන්නේ,
(i) පරිදේවය යනුවෙනි
(ii) ප්‍රිය විප්‍රයෝගය යනුවෙනි
(iii) අප්‍රිය සම්ප්‍රයෝගය යන්නය.

(20) මිත් අෂ්ඨාර්ය පුද්ගලයෙකු නොවන්නේ,
(i) කොණ්ඩඤ්ඤ මහ රහතන්වහන්සේය
(ii) දෙව්දත් තෙරුන්ය
(iii) යුදොවුන් රජතුමා

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# බුද්ධ ධර්මය
(II කොටස )

08 වන ශ්‍රේණිය

පැය 01 මිනිත්තු 30

නම/ විභාග අංකය .......................................................

සැලකිය යුතු කරුණු
මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්යය, එය කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නයකි, ලකුණු 16 ක් ලැබේ. සෙසු ප්‍රශ්න 06 න් 04 කට පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු 11 බැගින් මුළු ලකුණු 44 කි.

---

(01) අනිවාර්ය ප්‍රශ්නය

(i) වෘක්ෂ ලතාවලින් හෙබි පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

(ii) වෘක්ෂ ලතා විනාශ කිරීම නිසා ජීවී ලෝකයට බලපාන අහිතකර ප්‍රතිවිපාක 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

(iii) අරණ්‍ය ගත පරිසරයකදී ඔබ ලබන අසිරිය වාක්‍ය 4 න් ලියන්න. (ලකුණු 4 යි)

(iv) බොදු දරුවකු ලෙස ගස්වැල් සුරැකීමට කළ හැකි පරිත්‍යාග 2 ක් ලියන්න. (ලකුණු 2 යි)

(v) දූෂණය වූ පරිසරයකදී ඔබ විඳි අපහසුතාවන් දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

(vi) බුදු සිරිත ඇසුරින් පරිසරය ආශ්‍රිතව සිදුවූ වැදගත් සිදුවීම් 4 ක් ලියන්න. (ලකුණු 4 යි)

(02) (i) චතුරාර්ය සත්‍ය අඩංගු සූත්‍ර දෙකක නම් ලියන්න. (ලකුණු 2 යි)

(ii) "දුක්ඛ" ලෙස හඳුනාගත් ස්වභාවයන් 3 ක් අදහස සහිතව ලියන්න. (ලකුණු 3 යි)

(iii) පංච උපාදානස්කන්ධය හා පංචස්කන්ධය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2 යි)

(03) (i) "ආගන්තුකයා" යනු කවරෙක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2 යි)

(ii) ඔබ ආගන්තුකයෙකු ලෙස අනුගමනය කරන සිරිත් 3 ක් කෙටියෙන් පහදන්න. (ලකුණු 3 යි)

(iii) ආගන්තුක සත්කාරය පිළිබිඹු වන අවස්ථා 3 ක් බුදු සිරිතෙන් ගෙනහැර දක්වමින් එහි වැදගත් කම අගය කරන්න. (ලකුණු 6 යි)

(04) (i) කර්මයෙහි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) කරුණු දෙකක් දක්වමින් ධම්ම චරියාවේ විපාක පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 3 යි)

(iii) කර්මයෙහි විපාක පිළිබඳ විශ්වාසය කරන්නෙකු තුළ දැකිය හැකි ගුණාංග 3 ක් දක්වමින් ඔහු ගැන ඇගයීමක් කරන්න. (ලකුණු 6 යි)

(05) (i) ''බුද්ධානුස්සති භාවනාව එක් වාක්‍යයකින් හඳුන්වන්න. (ලකුණු 2 යි)

(ii) ඔබ කැමති නව අරහාදි බුදු ගුණ වලින් 3 ක් ලියා එයින් අදහස් කරන ගුණය සරල බසින් ලියන්න. (ලකුණු 3 යි)

(iii) බුද්ධානුස්සති භාවනාවෙන් ලැබෙන අනුසස් 3 ක් ලියා ඒ සිසු දිවියට සම්බන්ධ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6 යි)

(06) (i) බුදු දහමට අනුව ඇසුරු කළ යුතු මිතුරන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2 යි)

(ii) යොදා ඇති නම් අනුව ඔබ නම් කරන මිතුරන් දෙදෙනෙකුගේ ස්වභාවය කෙටියෙන් පහදන්න. (ලකුණු 3 යි)

(iii) අයහපත් මිතුරු ඇසුර අයහපතම උදාකරයි. උදාහරණ 03 ක් දක්වමින් මෙම අදහස තහවුරු කරන්න. (ලකුණු 6 යි)

(07) (i) ශිෂ්ඨ සම්පන්න ඇඳුමක් තෝරා ගැනීමට පෙර ඔබ විසින් සලකා බැලිය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

(ii) ''සේඛියා ධර්ම යන්න කෙටියෙන් පහදන්න.'' (ලකුණු 3 යි)

(iii) හොඳ ආහාර පුරුදු 4 ක් සඳහන් කොට ඉන් දෙකක් අගය කරන්න. (ලකුණු 6 යි)